www.xtrapapers.com

Cambridge Assessment International Education

# Cambridge O Level

**SINHALA** **3205/02**

Paper 2 Translation and Reading Comprehension **May/June 2022**

INSERT **1 hour 30 minutes**

**INFORMATION**

- This insert contains the reading passage.
- You may annotate this insert and use the blank spaces for planning. **Do not write your answers** on the insert.

This document has **2** pages.

KI 219685
© UCLES 2022

www.xtrapapers.com



Read the following passage carefully and then answer, briefly and in **Sinhala**, **Questions 3–14** on the Question Paper.

දක්ෂ ලේඛකයෙකු හෝ සාහිත්‍ය නිර්මාණකරුවෙකු වීම සඳහා ජීවිත අත්දැකීම් යම් අයෙකුට ඉවහල් විය හැක. ලෝක ඉතිහාසයේ මීට බොහෝ නිදසුන් තිබේ. දහනවවැනි සියවසේ ප්‍රංශයේ පහල වූ ගී ද මෝපසාන්ග් එවැන්නෙකි. ඔහු ප්‍රංශ සාහිත්‍යය වෙනත් මගකට යොමු කල නවකථාකරුවෙකු, කෙටිකථාකරුවෙකු සහ කවියෙකු විය.

ගී ද මෝපසාන්ග් උපත ලැබුවේ වසර 1850 දී ප්‍රංශයේ පැරිස් නුවරය. සිය පවුලේ හැල හැප්පීම් කුඩා වයසේ සිටම දුටු ඔහු, එයට අමතරව සිය රටේ පැවැති යුද්ධයද අත්දැකීම් කර ගත්තේය. සිය කුඩා වයසේදී ම මවගෙන් වෙන් වූ පියා නොමැතිව හැදුනු වැඩුණු ඔහුගේ ආදර්ශය වූයේ පියෙකු නොමැතිව සිය පවුල ඉදිරියට ගෙනගිය සිය ධෛර්යයමත් මවයි. කුඩා මෝපසාන්ග් සිය මව අනුගමනය කරමින් ඇය මෙන්ම පොත්පත් කියැවීමට හා සාහිත්‍යයට දැඩි කැමැත්තක් දැක්වූයේය. සිය මව ශේක්ස්පියර් කෘතිවලට විශාල කැමැත්තක් තිබෙන බැව් ඔහුට අවබෝධ විය.

සිය මූලික පාසැල් අධ්‍යාපනයට මෝපසාන්ග් වැඩි කැමැත්තක් නොවූයේ එහි තිබූ දැඩි ආගමික ඉගැන්වීම් නිසාය. එනමුත් සාහිත්‍ය ආදී විෂයයන් තිබූ සිය ද්විතීය අධ්‍යාපනයට ඔහු කැමැති විය.

මෝපසාන්ග් ගේ ජීවිතයේ ඉතා වටිනාම හමුවීම සිදුවූයේ සිය මවගේ මෙහෙයවීමෙනි. ඒ, ප්‍රංශ ජාතික මහා ලේඛක ගුස්ටාව් ෆ්ලොබෙයාර් හමුවීමයි. සිය පුතාගේ දක්ෂකම් සහ ඒ සඳහා අවශ්‍ය මගපෙන්වීම ඔහුගේ මව විසින් මේ වනවිට අවබෝධ කොටගෙන තිබිණි. ඇය හැකි සියලු අයුරින් මෝපසාන්ග්ට ඒ සඳහා අනුග්‍රහය දැක්වීය. මහාලේඛක ෆ්ලොබෙයාර් ද මෝපසාන්ග්ට ඉතා අගනා අන්දමට උදව් උපකාර කලේය. ඒ උදව් කෙතරම් මෝපසාන්ග්ට වැදගත් වූයේ ද යත්ත මෝපසාන්ග් සිය කුළුදුල් නිර්මාණය කලේ ද ෆ්ලොබෙයාර් ගේ මගපෙන්වීම අනුවය.

කෙසේ වුවද, මෝපසාන්ග්ට සිය සාහිත්‍ය කටයුතුවලින් තරමක් දුරට ඈත්වීමටත්, අනිවාර්ය යුධ සේවයේ යෙදීමටත්, එවකට ප්‍රංශයේ පැවති ප්‍රංශ-පර්සියානු යුද්ධය හේතු විය. ඒ අනුව ඔහු වසර දහයක් ප්‍රංශ නාවික හමුදාවේ සේවය කලේය. මේ කාලයෙන් පසු ඔහු ප්‍රංශ පුවත්පත් කිහිපයකම කර්තෘවරයෙකු වශයෙන් සේවය කල අතර, ඒ සමගම සිය සාහිත්‍ය නිර්මාණ කටයුතු සිදු කලේය. කෙටිකථා සංග්‍රහයක් වූ සිය කුළුදුල් නිර්මාණයෙන්ම මෝපසාන්ග් ප්‍රසිද්ධියට පත්වූ අතර, එහි පිටපත් ගණනාවක් විකිණී ගියේය. එයින් වසර දෙකකට පසුව, එනම් 1883 දී ඔහු සිය පළමු නවකථාව පල කලේය. වසරකට අඩු කාලයකදී ඉන් පිටපත් විසිපන්දහසක් විකිණී ගියේය.

මෝපසාන්ග් විසින් සිය කෙටි ජීවිතකාලය තුල දී ලියා පලකොට තිබෙන කෙටිකථා ගණන තුන් සියයක් පමණ වන අතර, නවකථා ගණන හයකි. වෙනත් කවි සහ නිර්මාණ බොහොමයකි.

සාහිත්‍ය ලෝකයට කරන ලද සේවය හේතුවෙන් ගී ද මොපසාන්ග් සලකනු ලබන්නේ "නවීන කෙටිකතාවේ පියා" වශයෙනි. ලොව භාෂා රැසකට පරිවර්තනය වී තිබෙන සහ බොහෝ දෙනා විසින් කියවා තිබෙන "දියමන්ති මාලය" නම් කෙටිකතාවෙන් ගී ද මෝපසාන්ග් නාමය බොහෝ කාලයක් සාහිත්‍ය ඉතිහාසය තුල රැඳී තිබෙනු ඇත.

Permission to reproduce items where third-party owned material protected by copyright is included has been sought and cleared where possible. Every reasonable effort has been made by the publisher (UCLES) to trace copyright holders, but if any items requiring clearance have unwittingly been included, the publisher will be pleased to make amends at the earliest possible opportunity.

To avoid the issue of disclosure of answer-related information to candidates, all copyright acknowledgements are reproduced online in the Cambridge Assessment International Education Copyright Acknowledgements Booklet. This is produced for each series of examinations and is freely available to download at www.cambridgeinternational.org after the live examination series.

Cambridge Assessment International Education is part of Cambridge Assessment. Cambridge Assessment is the brand name of the University of Cambridge Local Examinations Syndicate (UCLES), which is a department of the University of Cambridge.

© UCLES 2022 